# අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
## වෘත්තීය අධ්‍යාපන අංශය
# ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

## පුරප්පාඩු

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, වෘත්තීය අධ්‍යාපන අංශය යටතේ පවතින ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා ස්ථිර පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.**

### 01. උපදේශක - (MA 2 – 2)
### ලං.ජ.කා.අ. ආයතනය - තනතුරු 28
### ලං.ජ.කා.අ. ආයතනය - ආණමඩුව කලාපීය මධ්‍යස්ථානය - තනතුරු 02

### 02. උපදේශක - දෙමළ මාධ්‍ය (MA 2 – 2) - තනතුරු 03

**සුදුසුකම්:-**

**බාහිර:-**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් පහත සඳහන් ක්ෂේත්‍රයකින් NVQ 5 5 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම. මෝටර් රථ (Automobile), මෙකට්‍රොනික් (Mechatronic), මිල්රයිට් (Millwright), බල විදුලි (Power Electrical), වායු සමීකරණ සහ ශීතකරණ (A/C & Refrigeration), යන්ත්‍රෝපකරණ (Tool Machinery), මෝටර් රථ විදුලි (Auto Electrical), ඩීසල් පොම්ප (Diesel Pump), වෙල්ඩින් (Welding), මෝටර් රථ බොඩි අලුත්වැඩියාව සහ පින්තාරු කිරීම (Motor Vehicle Body Repair & Painting), ඉදිකිරීම් (Construction), විදුලි හා ඉලෙක්ට්‍රොනික යාන්ත්‍රික (Electric & Electronic Mechanical), තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ((ICT), ආහාර තාක්ෂණය (Food Technology).

හෝ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් පහත සඳහන් ක්ෂේත්‍රයකින් NVQ 4 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම. මෝටර් රථ (Automobile), මෙකට්‍රොනික් (Mechatronic), මිල්රයිට් (Millwright), බල විදුලි (Power Electrical), වායු සමීකරණ සහ ශීතකරණ (A/C & Refrigeration), යන්ත්‍රෝපකරණ (Tool Machinery), මෝටර් රථ විදුලි (Auto Electrical), ඩීසල් පොම්ප (Diesel Pump), වෙල්ඩින් (Welding), මෝටර් රථ බොඩි අලුත්වැඩියාව සහ පින්තාරු කිරීම (Motor Vehicle Body Repair & Painting), මෝටර් රථ කාර්මික (Automobile Mechanic), වෙල්ඩර් (Welder), යන්ත්‍රෝපකරු (Machinist), රසායනාගාර සහකාර (Laboratory Assistant), බේකරිකරු (Baker), කෙටුම්පත්කරු (Draftsperson), සහකාර ප්‍රමාණ සමීක්ෂක (Assistant Quantity Surveying), ඉදිකිරීම් අධීක්ෂක (Construction Site Supervisor), තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී (ICT Technician), පරිගණක දෘඩාංග සහ ජාල කාර්මික ශිල්පී (Computer Hardware and Network Technician), විදුලි කාර්මික (Electrician), පුනර්ජනනීය බල ශක්තිය හෝ වෙනත් අදාල තාක්ෂණික (Renewable Energy or any other related technical), යාන්ත්‍රික ක්ෂේත්‍රය (mechanical field). අපේක්ෂකයින්ට කර්මාන්තයේ හෝ පිළිගත් ආයතනයක අදාල විෂයයන් ඉගැන්වීමේ අවම වශයෙන් අවුරුදු තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය.

**අභ්‍යන්තර:-**

(අ) බාහිර අයදුම්කරුවන් සඳහා වන ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය -**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
MA 2-2 - රු. 50,540 - 540x10-630x07-1080x04-1280x20-9,270/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.)
2026.01.01 දිනට ගෙවන වැටුප - රු. 46,960.00

**බඳවා ගැනීමේ ක්‍රමය -**

තරගකාරී ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

### 03. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - (MA 1 – 2) - තනතුරු 09

**සුදුසුකම්:-**

**බාහිර:-**

(අ) අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් පැරණි නිර්දේශය යටතේ විෂයයන් හතරකින් හෝ නව නිර්දේශය යටතේ විෂයයන් තුනකින් සමත්වීම.

සහ

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුලුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් සමත්වීම.

**අභ්‍යන්තර:-**

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් සමත් වී ඇතට ප්‍රාථමික - ශිල්පීය නොවන (PL 1)– හා ප්‍රාථමික - ශිල්පීය (PL 3)– වැටුප් කාණ්ඩයේ අයට මේ සඳහා අයදුම් කල හැකිය.

**වැටුප් පරිමාණය -**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
MA 1-2 - රු. 46,220 - 540x10-630x07-1080x12-1280x12-84,350/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනාවන් සඳහා හිමිකම් ලබයි)
2026.01.01 දිනට වැටුප - රු. 43,312.00

**බඳවා ගැනීමේ ක්‍රමය -**

තරගකාරී ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

### 04. ආරක්ෂක පරීක්ෂක - (MA 1 – 2)
### ලං.ජ.කා.අ. ආයතනය - තනතුරු 01
### ලං.ජ.කා.අ. ආයතනය - ආණමඩුව කලාපීය මධ්‍යස්ථානය - තනතුරු 01

**සුදුසුකම්:-**

**බාහිර:-**

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුලුව විෂයයන් 06 කින් සමත්වීම.

සහ

රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර:-**

(අ) අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් සමත් වී ඇතට ප්‍රාථමික - ශිල්පීය නොවන (PL 1)– හා ප්‍රාථමික - ශිල්පීය (PL 3)– වැටුප් කාණ්ඩයේ සිටින අයට මේ සඳහා අයදුම් කල හැකිය.

**වැටුප් පරිමාණය -**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
MA 1-2 - රු. 46,220 - 540x10-630x07-1080x12-1280x12-84,350/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.)
2026.01.01 දිනට ගෙවන වැටුප - රු. 43,312.00

**බඳවා ගැනීමේ ක්‍රමය -**

තරගකාරී ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

### 05. වෛද්‍ය මධ්‍යස්ථාන සහායක - (MA 1 – 2) - තනතුරු 01

**සුදුසුකම්:-**

**බාහිර:-**

අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් විද්‍යා විෂය ධාරාවේ පැරණි නිර්දේශය යටතේ විෂයයන් හතරකින් හෝ නව නිර්දේශය යටතේ විෂයයන් තුනකින් සමත්වීම සමඟ අදාල ක්ෂේත්‍රය පිළිබඳ මනා දැනුමක් තිබීම සහ ප්‍රථමාධාර ක්‍රියාකාරකම් පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතුය.

**අභ්‍යන්තර:-**

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් සමත් වී ඇතට ප්‍රාථමික - ශිල්පීය නොවන (PL 1)– හා ප්‍රාථමික - ශිල්පීය (PL 3)– වැටුප් කාණ්ඩයේ සිටින අයට මේ සඳහා අයදුම් කල හැකිය.

**වැටුප් පරිමාණය -**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
MA 1-2 - රු. 46,220 - 540x10-630x07-1080x12-1280x12-84,350/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි)
2026.01.01 දිනට ගෙවන වැටුප - රු. 43,312.00

**බඳවා ගැනීමේ ක්‍රමය -**

ප්‍රායෝගික පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

**සියළුම තනතුරු සඳහා අදාල පොදු කොන්දේසි -**

- සියළුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- මානසික හා කායික වශයෙන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට සුදුසු විය යුතුය.
- ඉතා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
- ඉහත තනතුරුවලට බඳවා ගන්නා බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයක් සැපිරිය යුතුය. ඔහු/ඇය එම කාලසීමාව අවසානයේ දී පෙන්වනු ලබන සතුටුදායක කාර්ය සාධනය සහ පැවැත්ම අනුව, තනතුරෙහි ස්ථිර කරනු ඇත. දැනටමත් තනතුරෙහි ස්ථිර කර ඇති අභ්‍යන්තර අයදුම්කරුවන් වසර 01 ක වැඩ බලන කාලසීමාවකට යටත් වනු ඇත.
- ඉහත තනතුරුවලට බඳවා ගැනීම් අදාල තනතුරෙහි ආරම්භක වැටුප් පියවරට වේ.
- සේවක අර්ථසාධක අරමුදල සඳහා වැටුපෙන් 08% ක් අයකර ගනු ලබන අතර ඊට ආයතනයේ දායකත්වය 12% ක් හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල සඳහා 3% ක් වේ.

අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල ඡායා පිටපත් ස්වකීය අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික
(ඇ) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික
(ඈ) ජාතික හැඳුනුම්පත

දැනට රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ දෙපාර්තමේන්තුවල සේවය කරන අය තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් එවිය යුතු අතර අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු/ඇය සේවයෙන් නිදහස් කල හැකි බවට ආයතන ප්‍රධානියා සහතික කල යුතුය. ඥාතීන් නොවන ඔබ පිලිබඳව විමසිය හැකි දෙදෙනෙකු ඇතුලත්ව සම්පූර්ණ විස්තර සහිත අයදුම්පතක් තමා විසින් සහතික කරන ලද සහතිකවල පිටපත් සමග **2026.06.14 දිනට ප්‍රථම කළමනාකාර - පරිපාලන හා මානව සම්පත්, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය, අංක 582, ගාලු පාර, ගල්කිස්ස** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයෙහි ඉහල වම් කෙළවරෙහි අයදුම් කරන තනතුර නිවැරදිව සඳහන් කල යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

බඳවා ගැනීමට කිසිදු ආකාරයකින් බලපෑමක් කිරීම බඳවා ගැනීමට නුසුදුසුකමක් වනු ඇත.

**අධ්‍යක්ෂ - විදුහල්පති,**
**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය,**
**අංක 582, ගාලු පාර,**
**ගල්කිස්ස.**